# <u>ව්‍යාපාර කළමණාකරණ කමිටුව-රිදියගම ව්‍යාපාරය</u>

දිනය - 2019.04.09

වෙලාව - පෙ.ව 9. 30

ස්ථානය- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

## සහභාගී වූ රජයේ නිළධාරීන්

### ***<u>වාරිමාර්ග කළමණාකරණ අංශයය</u>***

01.කේ.කේ.ඉන්ද්‍රානි මිය - නේවාසික ව්‍යාපාර කළමණාකරු
02.ඩබ්.එන්.ජේ.වීරසිංහ මිය - සංවර්ධන නිළධාරී
03.ඩබ්.එම්.එන්.ලක්මාලි මිය - සංවර්ධන නිළධාරී
04.ඒ.කේ.එන්.ප්‍රියදර්ශනී මිය - සංවර්ධන නිළධාරී
05.ඒ.ජී.පී දමයන්ති මිය - සංවර්ධන නිලධාරි
06. බී.ජී ඉනෝකා ජයමාලි මිය - සංවර්ධන නිලධාරි
07.ජේ.එස් ඩෙල්කානි මිය - සංවර්ධන නිලධාරි

### ***<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>***

01.කේ.එච්.එන්.එස්.කුමාර මයා - වාරිමාර්ග ඉංජිනේරු - වා:දෙ අ/තොට
02. එච්.එච්.එන්.එච්.පීරිස් මයා - ඉංජිනේරු සහකාර - වා:දෙ අ/තොට
03.ඩබ්.ජී.සී.කොස්තා මයා - ඉංජිනේරු සහකාර -වා.දෙ. අ/තොට

### ***<u>ගොවිජනසේවා දෙපාර්තමේන්තුව</u>***

01. ඒ.ඩී ක්‍රිෂාන්ති මිය - ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරි - අ/තොට

### ***<u>ගොවි නියෝජිතවරු</u>***

1. ඒ.පී.විමලදාස මයා - ලේකම් ප්‍රගති ගොවි සංවිධානය
2. හැන්ඩි අබේදීරමයා - ලේකම්එකමුතුගොවිසංවිධානය
3. මංජු රෙජිනෝල්ඩ් මයා - භාණ්ඩාගාරික දිමුතු ගොවි සංවිධානය
4. ඒ.බී ආරියසේන මයා - සභාපති විජය ගොවි සංවිධානය
5. එස්.ඒ.පී ආනන්ද මයා - සභාපති ප්‍රගති ගොවි සංවිධානය
6. ශෂි එදිරිසූරිය මයා - ලේකම් සුහද ගොවි සංවිධානය
7. ඊ.පී.ජිනදාස මයා - භාණ්ඩාගාරික සරුකෙත/රුහුණු
8. ජේ.ඒ ප්‍රේමචන්ද්‍ර මයා - සභාපති සමගි ගොවි සංවිධානය
9. එම්.එම් පියදාස මයා - භාණ්ඩාගාරික සුහද ගොවි සංවිධානය
10. එම්.එම් ජයලතා මිය - සභාපති මහානාග ගොවි සංවිධානය
11. පී.ජී ගුණරත්න මයා - භාණ්ඩාගාරික මහසෙන් ගොවි සංවිධානය
12. ඩී.ඒ කරුණාදාස මයා - භාණ්ඩාගාරික ප්‍රගති ගොවි සංවිධානය
13. ඒ.එස්.ජී විල්සන් මයා - ලේකම් නීලසේනාපති ගොවි සංවිධානය
14. පී.විජේසූරිය මයා - ලේකම් රුහුණු ගොවි සංවිධානය
15. ආර්.ජී ඥානපාල මයා - ලේකම් ගාමිණී ගොවි සංවිධානය
16. ප්‍රසාද් විජේරත්න මයා - සභාපති කාවන්තිස්ස ගොවි සංවිධානය
17. ඩී සුමතිපාල මයා - භාණ්ඩාගාරික කාවන්තිස්ස ගොවි සංවිධානය
18. කේ.පී ඉන්ද්‍රාවතී මිය - භාණ්ඩාගාරික පුබුදු ගොවි සංවිධානය
19. එස්.පී සුබසීලි මිය - සභාපති සේනානායක ගොවි සංවිධානය

20. එච්.පී කුසුමාවතී මිය - සභාපති මහසෙන් ගොවි සංවිධානය
21. ඒ.එම් සුදුසිංහ මයා - සභාපති ථේරපුත්ත ගොවි සංවිධානය
22. ඩබ්.එච් ධන්කන් මයා - සභාපති රුහුණු ගොවි සංවිධානය
23. එච්.ඒ.ජී කරුණාදාස මයා - ලේකම් නීල ගොවි සංවිධානය

න්‍යාය පත්‍රානුකූලව පළමුව ආගම සිහිකිරීමෙන් පසු නේවාසික ව්‍යාපෘති කළමනාකරු කේ.කේ ඉන්ද්‍රානි මහත්මිය විසින් පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ලේකම් මහතා විසින් පසුගිය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි. එම වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් සමගි ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ සහ ථේරපුත්ත ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්තාව සභා සම්මත විය.
ඒකාබද්ධ ගොවි සංවිධාන කාරක සහා රැස්වීම ව්‍යාපාර කාර්යාලයේ නොපවත්වා වෙනත් ගොවි සංවිධාන බල ප්‍රෙද්ශ වල පැවැත්වීම පිළිබදව නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමිය සභාවෙන් විමසා සිටින ලදී.

ඒකාබද්ධ ගොවි සංවිධානය ස්වාධීනව කටයුතු කරන හෙයින් ඒකාබද්ධ ගොවි සංවිධානයේ රැස්වීම් පැවැත්වීම හා ඒ සදහා අදාල රජයේ නිලධාරින්ගේ සහභාගිත්වය අවශ්‍ය නොවන බවට තීරණය වූ අතර.
ඒකාබද්ධ ගොවි සංවිධාන කාරක සහා රැස්වීම එක් එක් ගොවි සංවිධාන බල ප්‍රෙද්ශයන්වල පැවැත්වීමට ඒකාබද්ධ ගොවි සංවිධානය තීරණ කල බව ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු ලේකම් ශෂී එදිරිසූරිය මහතා ප්‍රකාශ කර සිටියේය.

නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමිය කාර්යාලයේ නොමැති අවස්ථාවල (රාජකාරි නිමාවූ අවස්ථාවල)ගොවි සංවිධානවල කොන්ත්‍රත් මුදල් හා වෙනත් වියදම් සදහා බැංකුවෙන් මුදල් නිදහස් කර ගැනීම සදහා මෙම කාර්යාලයේ වෙනත් නිලධාරියෙකුට බලය පවරන ලෙස ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු ලේකම් ශෂී එදිරිසූරිය මහතා ඉල්ලා සිටින ලදී. මේ සම්බන්ධව ප්‍රධාන කාර්යාලය ද දැනුවත් කරන බව ද ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

## 01. <u>ආයතන සංවර්ධන කටයුතු- ජේ.එස් ඩෙල්කානි මිය - සංවර්ධන නිලධාරි රිදියගම ව්‍යාපාරය</u>

ගොවි සංවිධාන 15 ක නිලවරණ කටයුතු මැයි හා ජුනි මාසවල පැවැත්වීමට කටයුතු යොදා ඇතිබවත් යල් කන්නයට අදාල දැනුවත් කිරීම් සදහා මහසභා රැස්වීම් නිසි පරිදි පවත්වා ඇති බවත්,විගණනය කර නොමැති ගොවි සංවිධාන හැකි ඉක්මනින් විගණන කටයුතු සිදු කරන ලෙසත් එතුමිය දන්වා සිටියාය .

**<u>ආයතන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය - 2019 මාර්තු මාසය</u>**

| අ/අ | ගොවි සංවිධානය | නිළවරණ පැවැත්වීම | මහසභා පැවැත්විම | කාරකසභා පවැත්වීම | මුදල් සාරාංශ ලැබීම් | විගණනය | ව්‍යාපාර කමිටුවට පමිණීම |
|---|---|---|---|---|---|---|---|
| 1. | මහානාග | x | √ | x | √ | x | √ |
| 2. | පැරකුම් | x | x | √ | √ | x | √ |
| 3. | ගජබා | x | x | x | √ | √ | x |
| 4. | එක්සත් | x | √ | √ | √ | x | x |
| 5. | නීල සේනාපති | x | √ | √ | √ | x | √ |
| 6. | විජය | x | √ | x | √ | x | √ |
| 7. | සුභද | x | √ | √ | √ | √ | √ |
| 8. | සරුකෙත | x | x | √ | √ | √ | √ |
| 9. | මහසෙන් | x | x | x | √ | x | √ |
| 10. | අල්අක්බර් | x | √ | √ | √ | x | x |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 11. | දිමුතු | x | √ | x | √ | x | √ |
| 12. | එකමුතු | x | √ | √ | √ | x | √ |
| 13. | ජේරපුත්ත | x | x | √ | √ | √ | √ |
| 14. | රුහුණු | x | x | √ | √ | x | √ |
| 15. | පුබුදු | x | √ | √ | √ | x | √ |
| 16. | වීර | x | x | √ | √ | x | x |
| 17. | නීල | x | √ | √ | √ | x | √ |
| 18. | සේනානායක | x | √ | √ | √ | x | √ |
| 19. | ඉසුරු | x | √ | x | √ | x | x |
| 20. | සමගි | x | √ | x | √ | x | √ |
| 21. | ගාමිණී | x | √ | x | √ | x | √ |
| 22. | කාවන්තිස්ස | x | x | √ | √ | x | √ |
| 23. | ගෝඨාභය | x | x | √ | √ | x | x |
| 24. | වලව | x | x | √ | √ | √ | √ |
| 25. | ප්‍රගති | x | x | x | √ | x | √ |
| 26. | එකතුව | **0** | **14** | **16** | 25 | **05** | **19** |

. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ සුහද ගොවි සංවිධානය ලියාපදිංචි කර ඇතත් මේ වන තෙක් ලියාපදිංචි සහතිකයක් ලැබී නොමැති බව ගොවි සංවිධානයේ ලේකම් ශෂී එදිරිසූරිය මහතා කියා සිටියේය

## <u>02. වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු-කේ.එච්.එන්.එස් කුමාරමහතා</u>

**රිදියගම ජලාශයේ ජල ධාරිතාවය - අක්කර අඩි 26016**
**ජල කදේ උස - අඩි 19 අගල් 8**

දැඩි නියගයක් දිවයින පුරා පවතින අවස්ථාවක රිදියගම ජලාශය වාන් දැමූ බව වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසීය. කන්න රැස්වීම් තීරණ මත අප්‍රේල් 10 වන දින ජලය නිකුත් කිරීමෙන් යම් ප්‍රමාණයක ජලය අඩු වීමක් සිදු වන බව පැවසීය. නඩත්තු කටයුතු සිදු කරන බැවින් එසේ සිදු කිරීමට සිදුවන බවත් දින 03 ක් ඇතුලත සම්පූර්ණ ජල ප්‍රමාණය ලබා දෙන බව පැවසීය. මහවැලි ඉඩම්වල දැනට වගාකල ප්‍රමාණයන්ට අමතරව තවත් වගා කටයුතු නොකරන ලෙස දන්වා ඇති බව ද ප්‍රකාශ කර සිටි එතුමා වැඩිදුර අදහස් දක්වමින් කියා සිටියේ අවුරුද්දට පෙර වගා කටයුතු ආරම්භ කරන ලෙසයි.

### <u>වාරිමාර්ග ගැටළු වසදීමේ ප්‍රගතිය</u>

| අ.අ | ඉදිරිපත් කළ අය | ගැටළුව | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | සමගි ගොවි සංවිධානය | මහආර වැව අසල ඇති ඇල කණ්ඩිය කැඩී යාම පිළිබඳව අවස්ථා කහිපයක දීම ඉදරිපත් කර තිබූ බව නේවාසික ව්‍යාපෘති කළ:තුමිය කියා සිටියාය. | කණ්ඩිය සකස් කර ඇත. | වා.දෙ |
| 02. | රුහුණු ගොවි සංවිධානයේ සභාපති | මිගෝරිස් බස්නාවේ එක් පැත්තකින් කැඩුණු පැති බැම්ම සකස්කර දෙන ලෙසත් බිබුල බස්නාව ශුද්ධ කර දෙන ලෙසත් ඉල්ලීම. | අලුත්වැඩියා කර ඇත. | වා.දෙ |

| | | | | |
|---|---|---|---|---|
| | | LB2 1 ඇලේ පළමු කුඹුරට ජලය ලබා ගැනීමට අපහසු බව පවසන ලදී. | කුඹුර සකස් කර ගන්නා බව පැවසීය. | ගො;සං |
| 03 | ඉසුරු ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා | 4 ඇල ආස්තරණය තුලින් ජලය කාන්දු වන නිසා කුඹුරු වලට හානි සිදුවන බව පවසන ලදී. | නඩත්තු අරමුදල් වලින් බස්නාව ශුද්ධ කරන ලදී. | වා:දෙ |

<u>**පසුගිය වාර්තාවෙන් ඉදිරියට ගෙනා වාරිමාර්ග ගැටළු**</u>

| අ.අ | ඉදිරිපත් කළ අය | ගැටළුව | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | ගජබා ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික | ගොඩගම ඇලේ කණ්ඩියට කි.මී.1ක් පමණ පස් දමා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br><br>රක්ෂිතය වෙන් කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. | ඇස්තමේන්තු සකස් කර ඇති බව සහකාර වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසා සිටින ලදි ගොඩගම ඇලේ ගිලාබැස ඇති කොටස සාදා ගැනීම සදහා දකුණු පළාත් සභාව දැනුවත් කරන ලෙස වාරිමාර්ග ඉංජිනේරුතුමා පැවසීය.<br><br>ගොවි සංවිධාන සහයෝගයෙන් වාරිමාර්ග මැෂින් යොදා තාවකාලිකව සැකසිය හැකි බවත් රක්ෂිත සීමාවන් හි දැමීමට ගොවි සංවිධාන විසින් පස් සපයාගන්නේ නම් රක්ෂිත කණු ද ලබාදිය හැකි බව පැවසීය. | වා.දෙ |
| 02 | ප්‍රගති ගොවි සංවිධානයේ ගරු සභාපති | .දෙල් ගහ ළග ඇලේ පහළ කොටස සඳහා U ආස්තරණය කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br>බැරගම බෝගහ හන්දිය බටහිර පැත්තේ ඇළ කණ්ඩිය සේදී යාම නිසා කොන්ක්‍රීට් පාරටද හානි සිදුවී ඇත.<br><br>බෝගහ හන්දිය ප්‍රදේශයේ SLB ඇළ සහ SCB ඇළවල ජලය බෙදා හරිනු ලබන | ඇස්තමේන්තු සකස් කරන බව වා:ඉංජිනේරු තුමා පැවසීය.<br><br>ඇස්තමේන්තු සකස් කර මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව වා:ඉංජිනේරු මහතා පැවසීය<br><br>.<br><br>මිනුම් ලබාගත් බව | |

| | | | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ දොරවල් අලුත් වැඩියා කරදෙන ලෙසත් රොඩිය රක්කවල බස්නාව සුද්ධ කර දෙන ලෙසත් ඉල්ලා සිටියේය.<br><br>කුමුරුවල අතිරික්ත ජලය බස්නාවට බැස්සවීම සඳහා කුඹුරුවලට පයිප්ප ලබා දෙන ලෙස ද ඉල්ලා සිටින ලදී. | පැවසීය.<br><br>කුඹුරු ----- 02 ට 01 ක් ලෙස දමන බව පැවසීය. . | |
| 03 | විජය ගොවි සංවිධානයේ සභාපති | එදිරිසූරිය බස්නාව සුද්ධ කිරීමට චේන්සෝ එකක් සහ ස්කැවේටරයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.(අන්දර ගස් වැවී ඇත.) | අදාල මැෂින් දෙක ලබා දිය හැකි බව වාරිමාර්ග ඉංජිනේරුතුමා කියා සිටියේය. | වා.දෙ. |
| 04 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු සභාපති | LB 2 1 කෙත් ඇලේ පයිප්පයක දොර කැඩී ඇති බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.<br>LB 3 ඇලේ පැතිබැම්මේ ආරම්භයේ සිට මීටර් 500 ක් ගිය පසු දකුණු පැත්තේ එක් තැනකින් කඩා ගෙන ගොස් ඇත .<br>අංක 2හා3 ඇළවල්වල ඇස්තමේන්තු සකස්කළත් තවම මෙම ඉදිකිරීම සිදුකර නොමැත .<br><br>අංක 01 ඇළේ අවසානයේ බස්නාව ශුද්ධ කර තවත් මීටර් 800 ක් පමණ සුද්ද කිරීමට ඉතිරිව පවතී . | ඇස්තමේන්තු සකස් කර රුහුණුපුරට යවා ඇති බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය.<br><br>2019 වර්ෂයේ ප්‍රතිපාදන වලින් සකස් කර දිය හැකි බව පවසා සිටින ලදී.<br><br>ඇස්තමේන්තු සකස් කරන බව පැවසීය.<br><br>ගොයම් කැපීමෙන් පසුව මැසින් ලබා දිය හැකි බව පැවසීය. | වා.දෙ. |
| 05 | වලව ගොවි සංවිධානයේ ගරු සභාපති | රොඩීමැල්ල බස්නාව හා මහවැව බස්නාව සුද්ධ කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | අම්බලන්තොට ප්‍රාදේශීය සභාව දැනුවත් කිරීමෙන් පසු එම ආයතනය සමග රැස්වීමක් යොදා ගන්නා ලෙසත් එම ආයතනයත් සම්බන්ධ කරගෙන ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරමට කටයුතු කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා ප්‍රකාශ කර සිටියේය. | වා.දෙ.<br>ගො.සං |
| 06 | පුබුදු ගොවි සංවිධානයේ ගරු ලේකම් | උනාව බස්නාව සුද්ධ කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | බස්නාව සුද්ධ කිරීම සඳහා අනුමැතිය ලැබී අති බව ඉංජිනේරු සහකාර හිරාන් මහතා පැවසීය. ලබන මාසයේ (මැයි) ශුද්ධ | වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආර් බී 01 සහ ආර් බී 02 ඇළේ දොරවල් 02 හා ගෙවල් 02ක් අතරින් කුඹුරු වලට ජලය ලබා ගන්නා අතර එම කෙත් ඇළ මේ වනවිට වසා ඇති බව පවසන ලදි. | කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය.<br><br>ප්‍රදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව පුබුදු ලේකම් යු.ජී සිරිසේන මහතා පවසන ලදි. | |
| 07 | සේනානායක ගොවි සංවිධානයේ ගරු සභාපති | 3 ඇළේ පයිප්පයේ දොරවල් කැඩී ඇති නිසා එය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි<br>.<br>2 ඇලේ සියඹලාගස්විල බස්නාව ශුද්ද කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. සේනානායක ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් පාර කැඩී ඇති නිසා එය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි | දොරවල් සකස් කර දිය හැකි බව ඉංජිනේරු සහකාර කොස්තා මහතා පවසන ලදී.<br><br>.නඩ ත්තු කටයුතු වලින් සිදු කරන බව පවසන ලදි | වා.දෙ. |
| 08 | දිමුතු ගොවි සංවිධානයේ ගරු ලේකම් | ළිද ළග ඇනිකට් එක ළග පාර කැඩී ඇති බැවින් එය අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. LB 4 B ඇලේ අවසාන කොටසේ 50 ක් පමණ U ආස්තරණය කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලීය. | PEISEIP ව්‍යාපෘතිය මගින් සිදු කරන බව පැවසීය. | වා.දෙ. |
| 09 | ගෝඨාභය ගොවි සංවිධානයේ ගරු සභාපති | දිගත ප්‍රධාන කෙත් ඇළේ ආරම්භයේ මීටර් 15ක් පමණ කැඩී ගොස් ඇති නිසා ජලය ගෙන යාමට අපහසු බව පැවසීය. | .මූලික ප්‍රමුකතාවය මත අළුත්වැඩියා කිරිම සඳහා ස්කැවේටරයක් ලබා දෙන බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසන ලදි. | වා.දෙ. |
| 10 | පැරකුම් ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික | කඩවර ඇළට උඩින් වතුර යාම නිසා දැඩි අපහසුතාවයට මුහුණ පැමට සිදුවී ඇත. | ක්ෂේත්‍රපරීක්ෂණයක් සිදු කර අවශ්‍ය තීරණය ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසන ලදී. . | වා.දෙ. |
| 11 | ඉසුරු ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා | 5 වන කෙත් ඇලේ බෙන් බහින නිසා ඇළ කණ්ඩිය කඩා ගෙන ගොස් ඇත මේ නිසා ඇළ කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br>කුඩළු විල බස්නාව ශුද්ධ කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදි. | PEISEIP ව්‍යාපෘතිය මගින් සිදු කරන බව<br><br>බස්නාව ශුද්ධ කර දීමට අවශ්‍ය කටයුතු කරන බව පවසන ලදී. | වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| 12 | නීල ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා | ටකරන්ලන්ද එල් බි 01 කෙත් ඇල පටු කර ඇති හෙයින් ජලය ගෙන යාමේ අපහසුතාවයකට මුහුණ දී ඇති බව පවසන ලදි. | ස්ථානීය පරීක්ෂණයක් සිදු කර බලා තීරණයක් ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කරන ලදී. | වා:දෙ |
| 13 | විජය ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා | SLB4 ඇලේ සමෘද්ධි පාලම අසල කොටසට පැති බැම්මක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. (ප්‍රධාන ඇල මීටර් 50 ක් පමණ) | වෙනත් ආයතන වලින් සහයෝගය ලබාගත හැකි නම් ඇස්තමේන්තුවක් සකස් කර දිය හැකි බව ඉංජිනේරු තමා පවසන ලදී. | වා:දෙ<br>ගො:සං |
| 14 | වීර ගොවි සංවිධානයේ සභාපති මහතා | NRB ඇළේ ලාල්පවිල පැතිබැම්ම සකස් කර දෙන ලෙස ඉල්ලීය. | 2019 ප්‍රමඛතා ලැයිස්තුවට ඇතුලත් කර ඇති බව පවසන ලදී. | වා:දෙ |
| 15 | සමගි ගොවි සංවිධානයේ සභාපති මහතා | ටෝනි මහතාගේ කුඹුරට කෙත් ඇලෙන් අගල් 2 බටයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.<br>SLB ඇලේ ඉතිරි කොටස (100m)සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. | තාවකාලිකව බටයක් ලබා දීමට ව්‍යාපාර කමිටුවේ අනුමැතිය ලැබිණි.<br><br>ස්ථානීය පරීක්ණයක් සිදු කර තීරණයක් ගන්නා බව දන්වන ලදී. | වා:දෙ |
| 16 | පැරකුම් ගොවි සංවිධානයේ සභාපති මහතා | රෙගියුලේටරයක් ලබා දෙන ඉල්ලා සිටින ලදි. (CPO 13 හබරත්වල පාසලඅසල පාලම දක්වා) | ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තීරණයක් ගන්නා බව දන්වන ලදී. | |
| 17 | ප්‍රගති ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික තුමා | දෙල්ගහ ඇලේ රක්ෂිත ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටි අතර ගොවි සංවිධානයේ උප සභාපති තුමා රක්ෂිතය අනවසරයෙන් අල්ලාගෙන ඇති අතර එහි තැඹිලි පැළ හා පොල් පැළ සිටුවා ඇති බවත් ඔහුට අයිති ඇල කොටසේ දෙපස කොහිල වගා කර ඇති අතර එම ඇල කොටස ශුද්ධ කිරීමට විරුද්ධත්වය පල කරන බව ද ප්‍රකාශ කර සිටියේය. | ස්ථානීය පරීක්ෂණය සිදු කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය. | |
| 18 | වලව ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා | පුබුදු ගොවි සංවිධානයේ හිටපු ගරු සභාපති තුමාගේ ඇලේ එන වැඩි වතුර නිසා තමාගේ කුඹුර ජලයෙන් යට වන බව වලව ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා සිටි අතර මේ පිළිබව සුදුසු තීරණයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.<br>කඩවර වැවේ වතුර SRB ඇලේ ඇවිත් වලව යායේ | පුබුදු ගොවි සංවිධානයේ හිටපු සභාපති තුමා සමග සාකච්ඡා කිරීමෙන් පසු තීරණයක් ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසීය.<br><br>ක්‍රිප්ස් ව්‍යාපෘතිය යටතේ ගොඩගම ඇලේ පාලමේ වැඩ කටයුතු ආරම්භ | වා:දෙ<br>ගො:සං |

| | | | | |
|---|---|---|---|---|
| | | සිසිර මහතාගේ කුඹුර යට වන බව ගරු සභාපති මහතා පැවසීය. | කරන බව වාරිමාර්ග ඉංජිනේරු තුමා කියා සිටියේය. | |
| 19 | සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමා | සුපිරින්ටන් යායේ බස්නාවෙන් කුඹුරු වලට ජලය ලබා ගන්නා පයිප්ප පිලිබද ප්‍රශ්න ඇති බැවින් මේ පිළිබදව පරීක්ෂා කර බලා ඒ සදහා අදාල පයිප්ප ලබා දෙන ලෙස යෝජනා කළේය. | | |
| 20 | එකමුතු ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | පී 28 ඇලේ කණ්ඩිය කැඩී යන බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටියේය. | වතුර දුන්පසු ශුද්ධ කරනවා ප්‍රධාන ඇලේ වේල්ල බැදීම සහ පැති බැම්මේ ඉතිරි කොටස සකස් කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය. | වා:දෙ |

<u>නව වාරිමාර්ග ගැටළු</u>

| අ/අ | ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමා | කුඹුර සිසැමට පෙර පුල්පල්ම බස්නාව ශුද්ධ කිරිමට කුඩා ස්කැවේටරයක් ලබා දෙන ලෙස ඉල්ලීය | | |
| ‘ | දිමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික තුමා | ටෙනිසන් බස්නාව් රක්ෂිතය ගොවින් විසින් බලහත්කාරයෙන් අත් පත් කර ගෙන ඇත. | අද දින ( 04/05) දින ජේ.සි.බි මැෂින් එක ලබා දෙන බැවින් එහිදි වැට ඉවත් කරන බව ඉ/සහ කොස්තා මහතා පැවසිය. | වා:දෙ ගො:සං |
| 03 | කාවන්තිස්ස ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා | දම්සිරිගම ඇලේ ඇනිකට් එකේ දොර සකසා දෙන ලෙස ඉල්ලීය. 28 ඇලේ පාර හරහා තිබෙන පයිප්පයත් පාරත් කැඩී ඇත.<br><br>බස්නාව ශුද්ධ කිරීමටත් ඇල බට ලබාදීම පිළිබදවත් වා:දෙපාර්තමේන්තුවට ස්තුතිය පුද කරන ලදී. | ස්ථානීය පරීක්ෂනයක් සිදු කරන බව පැවසීය. | වා:දෙ |
| 04 | මහානාග ගොවි සංවිධානයේ ගරු සභාපති තුමිය | NRB ඇල කොන්ක්‍රීට් කර ඇතත් දෙපස පස්දමා රක්ෂිතය වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටියාය. ඇල අවසානයට ජලය ගෙන යා නොහැකි බව ද එතුමිය පවසා සිටියාය.<br><br>ප්‍රධින ඇල ශුද්ධ කිරීම පිළිබදව ස්තුතිය ප්‍රකාශ කරන ලදී | ස්ථානීය පරීක්ෂනයක් සිදු කරන බව පැවසීය. | |
| 02 | රුහුණු ගොවි සංවිධානයේ ගරු | මෙහෙයුම් නඩත්තු මුදල් මෙම වර්ෂයේ ද ලබා දෙන ලෙස | | |

| | | | | |
|---|---|---|---|---|
| | සභාපති තුමා | ඉල්ලීය. LB 3 ඇලේ මදච්ච සහ දොර එය අසල ඇති කුඹුරේ අයිතිකරු විසින් කඩා දමන බැවින් එය විශාල ගැටලුවක් වී තිබේ.<br>වාරිමාර්ග ආඥා පනත පිළිබදව ගොවි නායකයින්ට පුහුණු වැඩ සටහනක් පවත්වන ලෙස ද පැවසීය. | | |
| 03 | මහසෙන් ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමා | පාර සැකසීමට ට්‍රැක්ටර් 02 හා JCB යන්ත්‍රයක් ලබාදීම පිළිබදව ස්තූතිය ප්‍රකාශ කරන ලදී.<br>4 පයිප්පයෙන් ජලය ගෙන යාමට අපහසු බව පැවසීය. | | වා:දෙ |

## PEISEIP ව්‍යාපෘතිය

2018/2019 වසරවල පේරපුත්ත,කාවන්තිස්ස,ගාමිණී,නීල සේනාපති,ගෝඨාභය,වලව,සුභද,දිමුතු සහ මහසෙන් ගොවි සංවිධාන වල PEISEIP ව්‍යාපෘතියෙන් අදාල පුනුරුත්තාපන සහ අනෙකුත් වැඩසටහන් සිදුකරන බව නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමිය පැවසුවාය.
සේනානායක,ඉසුරු,එකමුතු,රුහුණු,සුභද,විජය,සමගි,අල් අක්බර් ගොවි සංවිධානවල 2020 වසරේ දී PEISEIP ව්‍යාපෘතියෙන් අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව පැවසීය.

## ගොවිජනසේවා කටයුතු - ගොවිජනසේවා ප්‍රාදේශීය නිලධාරි ඒ.ඩී ක්‍රිශාන්ති මිය

යල කන්නයේ පොහොර නිකුත් කිරීම පසුගිය කන්නයේ සිදු කල ආකාරයටම සිදු කරන බව පැවසුවාය. අලුත් සහල් මංගල්‍ය වෙනුවෙන් උදව් උපකාර කළ සියලු දෙනාටම ස්තූතිය පුද කළේය. පේරපුත්ත,කාවන්තිස්ස ගොවි සංවිධානවල PEISEIP ව්‍යාපෘතියේ ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්මේ උස්බිම් මට්ටම් කිරීම සදහන් වී ඇත්තේ කෘෂිකර්ම ඵලදායිතා සංරචකය යටතේය. 2019/04/11 වන දින ගොවිජන සේවා කොමසාරිස් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත රැස්වීමේ දී මේ පිළිබදව ගොවීන් දැනුවත් කරන බව පැවසුවාය.

Indrani

| | | |
|---|---|---|
| ලේකම්,<br>ව්‍යාපාර කළමනාකරණ කමිටුව<br>රිදිගම ව්‍යාපාරය |  | කේ.කේ ඉන්ද්‍රානි<br>නේවාසික ව්‍යාපෘති කළමනාකරු<br>රිදියගම ව්‍යාපාරය |

පිටපත්:- 01. අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය - කොළඹ - කා:දැ:ස
02.ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට/ හම්බන්තොට - කා:දැ:ස

03. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(අ.ප.)-හම්බන්තොට - කා:දැ:ස
04. කෘෂිරක්ෂණ මණ්ඩලය - කා:දැ:ස
05. වාරිමාර්ග ඉංජිනේරු - අම්බලන්තොට - කා:දැ:ස
06. ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරි - අම්බලන්තොට - කා:දැ:ස
07. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - අම්බලන්තොට - කා:දැ:ස